# ක්ෂේත්‍ර නිලධාරීන්ට මැතිවරණයට ඉදිරිපත් වීම අහිමි වුණොත් මැතිවරණය කල් යෑමේ අවදානමක්?

**- පැෆරල් සංවිධානය**

**එච්.අයි. තුෂාර**

ක්ෂේත්‍ර නිලධාරීන්ට පළාත් පාලන ආයතන මැතිවරණයට ඉදිරිපත් වීමට ඇති අවස්ථාව අහිමි වී ගියහොත් මැතිවරණය කල් යෑමේ අවදානමක් ඇති වී තිබෙන බව පැෆරල් සංවිධානය පවසයි.

පළාත් පාලන ආයතන පනතට අනුව රජයේ ක්ෂේත්‍ර නිලධාරියෙකු රාජකාරී සිදු කරන බලප්‍රදේශයෙන් මැතිවරණයට ඉදිරිපත් වෙනවා නම් වසරකට පෙර එම බලප්‍රදේශයේ කටයුතුවලින් ඉවත් වී වෙනත් ප්‍රදේශයකට මාරු වී යා යුතු බවට නීතියක් පවතින බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

නව මැතිවරණ ක්‍රමයක් ඇති කිරීමෙන් පසු ලබන වසරේ පෙබරවාරි මාසයේ මැතිවරණය පැවැත්වීමට තීරණය කර තිබෙන හෙයින් ක්ෂේත්‍ර නිලධාරීන්ට ස්ථාන මාරු ලබාගෙන වසරකට පසු ඡන්දයට ඉදිරිපත් වීමේ අවස්ථාව අහිමි වී තිබෙන බවත්, මේ නිසා අයිතිවාසිකම් ලබාගැනීමට ක්ෂේත්‍ර නිලධාරීන් කිහිපදෙනෙකු අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවත් ඔහු පවසා සිටියේය.

මේ නිසා පළමු වතාවට මෙම නීතිය ඉවත් කිරීමට පාර්ලිමේන්තු නියෝජිතයන් කටයුතු කළහොත් ඇති වී තිබෙන ගැටලුව විසඳගැනීමට අවස්ථාව උදාවන බවත්, මේ නිසා මෙම මැතිවරණයට පමණක් උපයෝගී වන ආකාරයට කඩිනම් සංශෝධනයක් ගෙන ඒමට පාර්ලිමේන්තුව කටයුතු කළ යුතු බවත් විධායක අධ්‍යක්ෂවරයා කියා සිටියේය.

එසේ නොවුවහොත් මෙම ගැටලුව මුල් කරගනිමින් ඡන්දය කල් යෑමේ අවදානමක් පවතින බවද විධායක අධ්‍යක්ෂවරයා පැවසීය.



පසුගිය කාලයේ මැතිවරණවලට ඉදිරිපත් වූ රජයේ සමහර ක්ෂේත්‍ර නිලධාරීන් බලය අයුතු ලෙස භාවිත කිරීම නිසා මෙවැනි නීති ගෙනැවිත් තිබෙන බවත්, සිදුවන දූෂණ, වංචා සැලකිල්ලට ගැනීමේදී එම නීතිය සුදුසු බවත් ඒ මහතා කියා සිටියේය.

එහෙත් එවැනි නීතියක් තුළින් කිසිවෙකුගේ දේශපාලන අයිතියට හානියක් සිදුවනවා නම් එය නිවැරදි කරගත යුතු බවද හෙතෙම පවසා සිටියේය.